
# මූලික තොරතුරු
# 2023


# මූලික දත්ත
# කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| | | |
|---|---|---|
| පළාත | - | බස්නාහිර |
| දිස්ත්‍රික්කය | - | ගම්පහ |
| මැතිවරණ කොට්ඨාශය | - | ගම්පහ 02 |
| මැතිවරණ බල ප්‍රදේශය | - | කැලණිය |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නම | - | කැලණිය |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලිපිනය | - | කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>මහර, කඩවත |
| දුරකථන අංකය | - | 0112925268 |
| ෆැක්ස් අංකය | - | 0112926666 |
| පලාත් පාලන ආයතන | - | කැලණිය ප්‍රාදේශීය සභාව, බුළුගහහන්දිය, කැලණිය<br>පැලියගොඩ නගර සභාව, පැලියගොඩ |
| කොට්ඨාශයේ මුළු භූමි ප්‍රමාණය | - | හෙක්ටයාර් 2000.08 |
| ග්‍රාම නිළධාරි කොට්ඨාශ | - | 37 |
| ගම්පහ නගරයට ඇති දුර ප්‍රමාණය | - | කි.මී.14 |
| ජනගහනය | - | 151018 |
| නිවාස සංඛ්‍යාව | - | 34,253 |
| පවුල් සංඛ්‍යාව | - | 37389 |
| සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව | - | 2007 |
| ප්‍රධාන නගර | - | කිරිබත්ගොඩ, කැලණිය |
| පාසල් සංඛ්‍යාව | - | 25 |
| පිරිවෙන් | - | 05 |
| ආගමික ස්ථාන | - | බෞද්ධ විහාරස්ථාන - 53<br>සිල් ආරාම - 09<br>දහම් පාසල් බෞද්ධ - 48<br>කතෝලික දේවස්ථාන - 11<br>කතෝලික දහම් පාසල් - 09<br>හින්දු කෝවිල් - 08<br>ඉස්ලාම් දේවස්ථාන - 04 |
| සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය | - | මිලි මීටර් 2216.7 |
| සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය | - | පැරන්හයිට් 80 |
| මුහුදු මට්ටමේ සිට උස | - | අඩි 0-30 අතර |
| ප්‍රධාන ජල මාර්ග | - | කැලණි ගඟ |
| පිහිටීම | - | උතුරින් - මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය<br>නැගෙනහිරින් - බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය<br>දකුණින් - කැලණි නදිය<br>බස්නාහිරින් - වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |


# කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම



# දිස්ත්‍රික්කය තුළ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම



# කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පොලිස් බල ප්‍රදේශ අනුව සිතියම



# ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකා ද්වීපය සිව් බුදුවරුන්ගේ සමයෙහි ඕජ දීපය, වර දීපය, මණ්ඩ දීපය, ලංකා දීපය වශයෙන්ද, මහා රාවණ යුගයේදී ලංකාපුර, ලංකා වශයෙන්ද හඳුන්වා ඇත. ඉන්පසු ඉංග්‍රීසි යුගය දක්වාම 'සිංහලයන්ගේ රට', සීහල රට හා සීහල දීප ආදී වශයෙන් හැඳින්විය. විජය රාජ යුගයේ තම්බපණ්ණි වශයෙන්ද දඹදිව චන්ද්‍රගුප්ත හා ග්‍රීක ජාතික මෙගස්තීන් රාජ යුග වල ටොලමි විසින් තැප්‍රොබේන් වශයෙන්ද හඳුන්වා ඇත.

වංශකතා වල හා විදේශිකයින් විසින් සිංහලයන්ගේ රට යන අර්ථය ඇති සිමොන්ඩු, සෙයිලදීප, සිලිකේ, ඉලංගෙ, සෙරන්ඩිබ්, සෙරන්දිව්, සහිලාන්, සෙයිලාන් යන නම් වලින්ද පෘතුග්‍රීසීන් සෙලාවෝ නමින්ද ඉංග්‍රිසීන් සිලෝන් ආදී නමින්ද හැඳින්විය. පසුව ශ්‍රී ලංකාව වශයෙන්ද, ස්වාධීන ශ්‍රී ලංකා ජනරජය වශයෙන්ද, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය වශයෙන්ද හඳුන්වයි.

ශ්‍රී ලංකාව තුළ සිව් හෙළයෝ ජීවත් වූහ. විටෙක පාලනයේ පහසුව සඳහා අනුරාධපුර යුගයේදී ලක්දිව උත්තර පස්සය, දක්කිණ පස්සය, පච්චිම පස්සය, ප්‍රාචීන පස්සය ආදී වශයෙන් කොටස් 5 කට බෙදිණි. ශ්‍රී මහා බෝධිය ලක්දිවට වැඩමවීමෙන් පසුව රුහුණු, පිහිටි, මායා ලෙසින් ත්‍රී සිංහලයකට බෙදී පාලනය විය. එහිදී මාගම් පුරවරය 'රුහුණ' ලෙසත් ශ්‍රී මහා බෝධිය පිහිටි රට 'පිහිටි' ලෙසත් කඳු සහිත මලය රට 'මායා' ලෙසත් හැඳින්විය. විවිධ කාල සීමාවන් තුළ ගංහා, ඇළ, දොළ, තොටුපල ආශ්‍රය කොට ගනිමින් විවිධ කඩඉම් රාශියකට බෙදා වෙන්විය.

වර්තමානයේ ශ්‍රී ලංකාව පරිපාලනයෙහි පහසුව උදෙසා පළාත් 9 ට හා දිස්ත්‍රික්ක 24 කට බෙදා වෙන් කර ඇති අතර අපගේ කතා නායකත්වය දරණ 'කැලණිය කොට්ඨාසය' අයත් වන්නේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළටය.

1978 වර්ෂයේ සැප්තැම්බර් මස 07 වන දින ගැසට් නිවේදනය මඟින් පරිපාලන දිස්ත්‍රික් පනතේ 3 වන ඡේදය යටතේ නව දිස්ත්‍රික්කයක් ලෙස ප්‍රකාශයට පත් කෙරුණු මෙම ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 න් එකක් ලෙස 'කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය' දැක්විය හැකිය.

ගම්පහ දිස්ත්‍රික්කයකෝරළ පහකින් සමන්විත විය. නැගෙනහිර සියනෑ කෝරළය, බටහිර සියනෑ කෝරළය, අලුත්කුරු කෝරළය, දකුණු අලුත්කුරු කෝරළය හා හාපිටිගම කෝරළය එම කෝරළ පහයි.

ඒ අනුව කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බටහිර සියනෑ කෝරළයට හා අධිකාරි පත්තුවට අයත් වේ. අතීතයේ සීහ සහ නාග ගෝත්‍රිකයින් විසූ ප්‍රදේශය සී+නා කෝරළය පසුව සිහ+නා= සියනෑ කෝරළය වශයෙන්ද ව්‍යවහාරයට එක් වූ බව පැවසේ.

කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී කොට්ඨාස 37 කින් සමන්විත වේ. කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සුවිශේෂී ඓතිහාසික පසුබිමක් තුළ ගොඩනැගුණා වූද ගෞතම බුදුරජාණන් වහන්සේගේ පාදස්පර්ශයෙන් අති පූජනීයත්වයට පත් වූද, ධීර වීර ජන්මයන් හෙළයට දායාද කළාවූ ද, ඓතිහාසික යුධ වික්‍රමයන්ට දිරි දුන්නා වූද, ස්වභාව ධර්මයේ අපූර්ව වූ ආශීර්වාද ලද උතුම් පුණ්‍ය භූමියකි. එය රණ ශූරයින්ට තෝතැන්නක් වූ භූමියකැයි කිවහොත් වඩාත් නිවරැදි යැයි හැඟේ.

අතීතයේ මහා රාවණ රාජ්‍ය සමයේ රාම රාවණ යුධයෙන් පසුව රාම ජයග්‍රහණය කොට රාගම් පුරවරය පිහිටවනු ලැබීය. වර්තමානයේ කඩවතින් එහා පිහිටි රාගම මෙම ‘රාගම පුරය’යි. මහා රාවණගේ සොයුරු විභීෂණ රාගම් පුරයේ පාලනයෙන් පසු කැලණිය ප්‍රදේශයේ පාලකයා බවට පත් විය. ප්‍රාග් ඓතිහාසික යුගයේ යක්ෂ ගෝත්‍රිකයින් මෙන්ම නාග ගෝත්‍රිකයෝද කැලණිය ජනපදයේ විසූ බව කියවේ. ගෞතම බුදුරජුන්ගේ පාදස්පර්ශයෙන් පාරිශුද්ධත්වයට පත්වූ මණිඅක්ඛිත නා රජු, චූලෝදර, මහෝදර, කැලණි තිස්ස මහරජු මෙන්ම විහාර මහා දේවිය වැනි වීර කාන්තාවන්ගේ ද නිජ බිම වූයේ කැලණියයි. මෙවැනි ධීර පරිසර වටපිටාවක් තුළ බිහි වූ කැලණිය සුවිශේෂී වූ ජය භූමියකි.

## භූගෝලීය පිහිටීම

| | |
|---|---|
| උතුර | හුණුපිටිය දකුණ ග්‍රාම නිලධාරිකොට්ඨාසයට අයත් ලංකා පොහොර සංස්ථා සංකීර්ණය , මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| දකුණ | කැලණි ගඟ |
| නැගෙනහිර | තලවතුහේන්පිට දකුණ ,වරාකනත්ත ,කැලණිග්‍රාමනිලධාරිකොට්ඨාසය, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| බටහිර | පැලියගොඩගහබඩග්‍රාම නිලධාරිකොට්ඨාසය ,කැලණි ගඟ , වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයද පිහිටා ඇත. |

# භෞතික තොරතුරු

## දේශගුණය

දිවයිනේ නිරිත දිග ප්‍රදේශයේ පිහිටා ඇති මෙම ප්‍රදේශය තැනිතලා භූමියක් සහිත දේශගුණික ලක්ෂණ පෙන්නුම් කරයි. බොහෝ දුරට ඒකාකාරව ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් දක්නට ලැබෙන අතර අප්‍රේල්, මැයි, ජූනි මාස වලත් සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් යන මාස වලත් උපරිම වර්ෂාපතනයක් ලැබේ. මෙම ප්‍රදේශයට මූලික වශයෙන් වර්ෂාපතනය ලැබෙන්නේ නිරිතදිග මෝසම් සහ සංවහන වැසි මගිනි. මෙම කොට්ඨාශයේ වර්ෂය මුළුල්ලේම ඒකාකාර උෂ්ණත්වයක් දැකිය හැකිය. එය සාමාන්‍යයෙන් සෙන්ටිග්‍රේට් 27 ත් 29 ත් අතර වේ. මේ අනුව මෙහි සෞම්‍ය කලාපීය ලක්ෂණ දැක්වෙන දේශගුණයක් පවතී.

## පස

කැලණිය කොට්ඨාශයේ භූ විද්‍යාත්මක පසුබිම විශ්ලේෂණය කිරීමේදී මූලික වශයෙන් ලැටරයිට්, කබොක්, දියළු සහ මැටි අඩංගු පස් වර්ග මුළු කොට්ඨාශය පුරාම ව්‍යාප්තවීමක් දැකිය හැකි අතර ,භූ විද්‍යාදෙපාර්තමේන්තුවේ දත්ත සහ තොරතුරු අනුව මෙම පස් වර්ග විසිරීම මෙසේ දැක්විය හැක.

| | | |
|---|---|---|
| ලැටරයිට් | - | කොට්ඨාසයේ උතුරු අර්ධයේ බහුලව හමුවේ. |
| දියළු | - | කොට්ඨාසය පුරාම බහුලව ව්‍යාප්තව පවතී. |
| බොරළු | - | කොට්ඨාසයේ දකුණු හා මධ්‍යමස්ථාන වල බහුලව පවතී. |
| මැටි | - | ප්‍රධාන ජල මාර්ග අවට ප්‍රදේශයන්හි පැතිරී ඇත. |

## ජලාශ්‍ර හා ජල වහන රටා

විශේෂ ජලවහන පද්ධතියක් මෙම කොට්ඨාශය තුල දක්නට නොමැත. එහෙත් මීට වසර ගණනාවකට පෙර ඉතාමත් ක්‍රමවත් ජලවහන පද්ධතියක් තිබූ ආකාරය පැහැදිලි වන්නේ අක්‍රමවත් කොට්ඨාශ හරහා ගලා යන මහර මුදුන් ඇළ, සේපාල ඇළ සහ වේවැල්දූව, ඊරියවැටිය හා හුණුපිටිය කොට්ඨාශය හරහා ගලා බස්නා ඊරිය ඇළ මාර්ග වලිනි. මෙම ඇළ මාර්ග ප්‍රදේශය හරහා ගලා ගොස් කළු ඔයට එකතු වී කැලණි ගඟට එකතු වේ. කැලණි ගඟ කොට්ඨාශය මායිම් කරගෙන ගලා බසියි.

ප්‍රධාන වශයෙන් පැරණියන්ගේ වගා බිමක් වශයෙන් මුතුරාජවෙල හා පැතිර පැවති කුඹුරු යායකට හිමිකම් කී කැලණි පුරය පසුකාලීන නාගරීකරණයට ගොදුරු වීමෙන් අත් හැර දමන ලද කුඹුරු , ජලාශ හා අර්ධ වගුරු බිම් බහුල ප්‍රදේශයක් බවට පත්ව ඇත.

## භූ ලක්ෂණ

සීමිත භූමි ප්‍රදේශයක් ඇති මෙම කොට්ඨාශයේ භූ ලක්ෂණ ගැන විමසීමේදී වගුරු බවට පත්ව ඇති භූමි ප්‍රමාණය ප්‍රයෝජනයට නොගෙන අත්හැර දැමූ ඉඩම් ගණයට වැටේ. මුළු භූමියෙන් හෙක්ටයාර් 320ක් පමණ වගුරු හා ජලාශ බවට පත්ව ඇත.. වනවාසල, දිප්පිටිගොඩ, වෙදමුල්ල, ඊරියවැටිය වැනි ග්‍රාම නිළධාරි කොට්ඨාශ වල අර්ධ වගුරු බිම් විශාල පමාණයක් ඇත.

## ස්වභාවික සම්පත්

කැලණිය කොට්ඨාශයේ දක්නට ලැබෙන ස්වභාවික සම්පතකි වගුරු බිම්. මෙම කොට්ඨාශයේ ග්‍රාම නිළධාරි වසම් 37න් 15කම වගුරු බිම් දක්නට ඇත. කීර වගාව, තෘණ වගාව, මිරිදිය මසුන් ඇති කිරීම වැනි ස්වයං රැකියා ව්‍යාපෘති රාශියක් මෙම වගුරු බිම් උපයෝගී කොට ආරම්භ කර ඇත.එමෙන්ම කැලණි ගඟ මෙම ප්‍රදේශයේ විශාලතම ජලසම්පතයි.

කැලණිය ගඟ අසබඩ වැවෙන උණ ගස් ගඟ රක්ෂිතය ආරක්ෂා කරනවාත් මෙන්ම ආර්ථික කටයුතු රාශියක් පවත්වාගෙන යාමට ප්‍රයොජනවත් වේ. මෙම වගුරු බිම් පරිසර සමතුලිතතාවය රකිමින් ඵලදායී කාර්යයනට යොදා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම ඉතා වැදගත්ය.